# Pursuing Jesus - Sam J (12/08/2018)

## යේසුස්වහන්සේ ලුහුබැඳීම/ අනුගමනය කිරීම - Sam J (12/08/2018)

(විහිලුව) එක් කාන්තාවක් සහ පිරිමියෙක් දුම්රියක යමින් සිටියෝය. ඔබ හිනාවෙන හැමවිටම ඔබට මගේ ස්ථානයට එන්නට ආරාධනා කරන්නට මට හිතෙනවා යැයි කාන්තාව කීවාය. එවිට ඔහු උත්තරදෙමින්ඃ ආආආාවි... ඔයා තනියමද ඉන්නේ? ඇසුවේය. කාන්තාවඃ නැහැ, මම දත් දොස්තර කෙනෙක් යැයි කීවාය.

ලැදියාවකින් යුක්තව අප යේසුස්වහන්සේ ලුහුබැඳිය/අනුගමනය කළ යුත්තේ ඇයි? අප පව්කරුවන්ව සිටියදීම යේසුස්වහන්සේ පළමුවෙන් අප වෙනුවෙන් අපව ලුහුබැඳගෙන ආසේක. යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණ මිනිසෙකු ලෙස ජීවත්වීමට හේතුව වුනේ උන්වහන්සේ අපට බොහෝසේ ප්‍රේම කිරීමය. ඔබ කාට හෝ ප්‍රේම කරන්නේ නම් ඔබ එම තැනැත්තා හෝ තැනැත්තිය ලුහුබඳිනවා නේද? බයිබලය අපට මෙසේ කියයිඃ රෝම 5:6-8 මෙය සිදුවෙන්නට සලස්වන පිණිස ක්‍රිස්තුස්වහන්සේ හරි වෙලාවට ආසේක. අප සූදානම් වෙන තුරු උන්වහන්සේ සිටියේවත්, සිටින්නේවත් නැත. අපව සූදානම්කර ගැනීමට යමක් කර ගැනීමට නොහැකිව අප බොහෝ දුර්වලව සහ කැරලිකාරව, සිටියදීම මරණයෙන් පූජාවීමට උන්වහන්සේම දුන්සේක. අප එපමණ දුර්වල නොවුනා වුනත්, අප කළ යුතු මොනවාද කියා අප දැන නොගන්නවා ඇත. යහපත්, ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු උදෙසා යමෙකු මැරෙන්නට කැමතිවීම අපට තේරුම් ගැනීමට හැකිවෙනු ඇත. එහෙත් අපගෙන් උන්වහන්සේට කිසි ප්‍රයෝජනයක් නැතුව තිබියදී, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාණන් මරණයේ පූජාවට පත් කිරීමෙන් උන්වහන්සේගේ ප්‍රේමය එළිදැක්වූසේක.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ජීවිතය අප උදෙසා දීමෙන් අප කෙරෙහි ඇති උන්වහන්සේගේ ප්‍රේමය එළිදැක්වූසේක. යේසුස්වහන්සේ පළමුකොට අපට ප්‍රේමකොට අපව ලුහුබැඳ එන ප්‍රේමය මෙයයි.

එසේනම් අප ලැදියාවකින් යේසුස්වහන්සේ ලුහුබැඳිය යුතුවන්නේ ඇයි?

1. යේසුස්වහන්සේ ආවේ උන්වහන්සේ තුළින් අපව ධර්මිෂ්ඨ කරන පිණිසය. ආදම් තුළින් පැමිණි පාපය නිසා අපගේ ධර්මිෂඨකම කිලුටුවී ඇති බවත් දෙවියන්වහන්සේ සමග හරිගැසීමට දරන ලද ප්‍රයත්නය නිශ්ඵල වූ බවත් යේසුස්වහන්සේ දැනගෙන සිටි සේක. එබැවින් දෙවියන්වහන්සේ එවන ලද උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ තුළින් අපව දෙවියන්වහන්සේ සමග සමගිකරවන නැතහොත් දෙවියන්වහන්සේ වෙතට නැවත ගෙන ඒමට දෙවියන්වහන්සේට සැලැස්මක් තිබුණි.

*<u>රෝම 5:17</u> මක්නිසාද එක්කෙනාගේ වරද නිසා ඒ එක්කෙනා කරණකොටගෙන මරණය රජකම්කළේවී නම්, දෙවියන්වහන්සේගේ කරුණාවේද ධර්මිෂ්ඨකම නමැති දීමනාවේද බහුලත්වය ලබන අය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ඊට වඩා ජීවනයෙහි රජකම් කරන්නෝය!*

ධර්මිෂ්ඨකම යනු දෙවියන්වහන්සේ සමග හරිගැස්වී සිටීමයි, පාපයට හෝ වරදකාර හැඟීමකට අපේ ජීවිතයේ එල නොදැරිය හැකි තැනක සිටීමයි. අප ධර්මිෂ්ඨකමෙන් ජීවත්වන විට අප කිසිදාක පව් නොකළාක් මෙනි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ධර්මිෂ්ඨ කරනු ලැබීමේ ඇති අපූර්වත්වය මෙයයි. තවත් වරදට පත්කිරීමක් නැත. පාපය ගැන ඔබට චෝදනා කරන්නට හෝ වරදට පත්කරන්නට යක්ෂයාට බලයක් නැත! හාලෙලූයා! මේ නිසා යේසුස්වහන්සේව ලුහුබැඳීම වටිනවා නොවේද?

2. යේසුස්වහන්සේ අපට තදින්ම ප්‍රේමකරන නිසා-උන්වහන්සේගේ පැමිණීමට බල කළේ උන්වහන්සේගේ ප්‍රේමයයි. යම්කෙනෙක් අනුගමනය කරන්නට ඔබව පොළඹවන්නේ ආදරයයි. අප වැරදි කළත් වැටුණත් අවුල් කරගත්තත් දිනපතාම අපව ලුහුබැඳ එන්නේ උන්වහන්සේගේ කොන්දේසි රහිත ප්‍රේමයයි. අපේ නොදැනුවත්කම සහ වැරදීම් නිසා සමහර අවස්ථා වලදී අපි යේසුස්වහන්සේව අත්හැර දැමුවත් උන්වහන්සේ කිසිවිටෙක අපව අත් නොහරිනසේක. අප කෙරෙහි උන්වහන්සේගේ ප්‍රේමය නොබිඳී පවතියි.

ඔවුන්ගේ කැරලිකාරකම නිසා ඉශ්‍රායෙල් ජනතාව නෙබුකද්නේශර් රජු විසින් වසර 70කට බබිලෝනියේ වහල්කමට ගත්විටත් උන්වහන්සේ ඔවුන් දකින්නට පැමිණ ඔවුන් ගැන උන්වහන්සේගේ යහපත් වචනය ඉටුකරන බවට අනාගතවක්තෘ යෙරෙමියා තුළින් දෙවියන්වහන්සේ වචනයක් දුන්සේක. යෙරෙමියා (29:10) අප ගැන උන්වහන්සේගේ සිතුවිලි උන්වහන්සේ දන්නා බවත් අපට අනාගතයක් සහ බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනා බවත් කියන 11 වන පදය අපි සෑමදෙනාම දන්නෙමු. නුඹලා මට අඬගසා යාච්ඤා කරන විට මම නුඹලාට උත්තර දෙන්නෙමියි උන්වහන්සේ කියනසේක.

*යෙරෙමියා 31:3-4 දෙවියන්වහන්සේ මෙසේ කියනසේකඃ ස්වාමින්වහන්සේ පුරාණයේදී මට ප්‍රකාශවීඃ එසේය, එසේ සදාකාල ප්‍රේමයකින් මම නුඹට ප්‍රේමකළෙමි. එබැවින් නොසෙල්වෙන දයාබරකමකින් මම නුඹ ඇඳගතිමි. 4 එම්බා ඉශ්‍රායෙල් කන්‍යාව, නැවත නුඹ ගොඩනගන්නෙමි.*

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙලය "කන්‍යාව"කට සමාන කරනසේක. (ලිංගිකව කිසිවෙකු ස්පර්ශ නොකළ, පුරුෂයෙකු සමග ලිංගික සම්බන්ධතාවයක් පවත්වා නැති කාන්තාවක්).ඔබ පව්කර තිබුණත් ඔබ (දෙවියන්වහන්සේට) මට විරුද්ධව කැරලිගසා තිබුණත් ඒවා දෙස නොබලා, නුඹලා පාපයෙන් කිලුටු නොවූ, පාපයෙන් අතගසනු නොලැබූ, සෙනගක් ලෙස නුඹලා දෙස බැලීමට මම කැමතියි කියන දෙවියන්වහන්සේගේ ප්‍රේමය මෙහිදී ඔබට දැකිය හැකිද? මාගේ ශුද්ධකම තුළින් ඔබව දකින්නට මම කැමතියි. හාලේලූයා!

මෙතැන සිටින යම් කෙනෙකුට දෙවියන්වහන්සේ මෙසේ කියනසේක: ඔබේ අතීතයේ ඔබ මුහුණ දුන් අපයෝජනය සහ නින්දාව තිබියදී ඔබේ කන්‍යා භාවයට නැවත ඔබ නගාසිටුවන්නට මම කැමතියි. මම කාලයාගේ මුල සිටම ප්‍රේම කළ, පවිත්‍ර, කිසිවෙකු අත නොගැසූ පුද්ගලයෙකු ලෙස දකින පිණිස මම ඔබව තෝරා ගනිමි. එසේම මම තව දුරටත් නොකඩවාම ඔබට ප්‍රේම කරන්නෙමි. එබැවින් මාගේ ප්‍රේමවන්ත දරුවා භය නොවන්න, ලැජ්ජා නොවන්න, මක්නිසාද මාගේ ධර්මිෂ්ඨකම නමැති වස්ත්‍රය ඔබට හඳවා මාගේ ශුද්ධකම නමැති වස්ත්‍රයෙන් ඔබව සැරසුවෙමි.

කොන්දේසි විරහිත ප්‍රේමය මෙයයි. මෙපණ ගැඹුරින් අපට ප්‍රේම කරන මේ දෙවියන්වහන්සේව ලුහුබැඳීම අප විසින් කළ යුතුයැයි ඔබ සිතනවාද? අප ලැදියාවකින්,එනම් අපේ මුලු සිතින්ම යේසුස්වහන්සේව ලුහුබැඳිය යුතු නොවන්නේද?

3. මක්නිසාද යේසුස්වහන්සේ සමග මා සම්පූර්ණය: *යොහන් 15:5 මෙසේ කියයි: මම මිදිවැලය; නුඹලා අතුය. නුඹලා මා තුළද මා නුඹලා තුළද පවතින්නේ නම්, නුඹලා බොහෝ ඵල දරන්නහුය; මාගෙන් වෙන්ව නුඹලාට කිසිවක් කළ නොහැක.*

*කොලොස්සි 2:10-සියලු අධිපතිකමේද බලයේද හිස වන ක්‍රිස්තුස්වහන්සේ තුළට සම්බන්ධව සිටීමෙන් නුඹලාද සම්පූර්ණව සිටින්නහුය.*

4. මක්නිසාද සියලුම දේවල් උන්වහන්සේගේ නාමයට යටත්ය- සියල්ලටම රජුන්ව සහ ස්වාමින්ව සිටින යේසුස්වහන්සේගේ නාමය- යේසුස්වහන්සේ සමග ඔබ පරාජය වෙන්නට බැරිය. යේසුස්වහන්සේ එකම තැනැන්වහන්සේය. උන්වහන්සේ මෙන් වෙන කෙනෙක් නැත, උන්වහන්සේට සමාන කළ හැකි වෙන කෙනෙක් නැත, උන්වහන්සේට වඩා උසස් කෙනෙක් නැත. *එපීස 1:19-22 අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියා දැනගන්නා පිණිස නුඹලාගේ ඇස් පහදන ලෙසත්ය 20 උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඉෂ්ටකළාවූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ප්‍රකාරයට ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගුටුවා, 21 සියලු අධිපතිකමටත් බලයටත් පරාක්‍රමයටත් ස්වාමිකමටත් මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම්වලටත් වඩා උසස්කොට ස්වර්ගීය ස්ථානවල තමන් දකුණු පැත්තේ හිඳුවා, 22 සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළසේක.*

අපේ මුලු හදවතින්ම යේසුස්වහන්සේව ලුහුබැඳීම වටිනවාද? මේ යේසුස්වහන්සේ සර්වබලධාරී දෙවියන්වහන්සේය, සදාකාල පියාණන්ය, සමාදානයේ කුමාරයාය. යේසුස්වහන්සේ තුළ, උන්වහන්සේ තුළ, අප ජීවත් වන්නෙමු, හැසිරෙන්නෙමු සහ පවතින්නෙමු. (ක්‍රියා 17:28)

මේ පූර්ණ ජීවනය ඔබට දෙන පිණිස මළාවූ යේසුස්වහන්සේ නිසා ඔබට මේ ජීවනය ලැබිය හැකියි. ඔබට ගෙවිය නොහැකිවූ දෙය උන්වහන්සේ තම ලේවලින් ගෙවූසේක.

මේ යාච්ඤාවත් සමග මට අවසන් කරන්නට ඉඩ දෙන්න. *එපීස 1:17-19 එසේ කරන්නේ මහිමයේ පියාණන් වන අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේ, උන්වහන්සේ ගැන දැන ගැනීමට ප්‍රඥාවේද එළිදරව් කිරීමේද ආත්මය නුඹලාට දෙන ලෙසත්. 18 උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක්ද කියාත් ශුද්ධවන්තයන් තුළවූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියාත්, 19 අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැනගන්නා පිණිස නුඹලාගේ සිත් නැමති ඇස් පහදන ලෙසත්ය.*

යේසුස්වහන්සේ ගැන ඔබ කොතරම් ඇල්මක් දක්වනවාද? යේසුස්වහන්සේ ලුහුබැඳීමට අප කොතරම් අධිෂ්ඨානයෙන් සිටිනවාද? ඔබට තිබෙන ඇල්මේ ප්‍රමාණය අනුව ඔබේ මුලු හදවතින්ම උන්වහන්සේ ගැන ලැදියාවක් ඇල්මක් දක්වන්නටත් උන්වහන්සේට සේවය කරන්නටත් ඔබව මෙහෙයවනු ඇත.

උන්වහන්සේ විසින් උන්වහන්සේ තුළ මාව ධර්මිෂ්ඨකර තිබෙන බැවින්, උන්වහන්සේ මට දක්වන දැඩි ප්‍රේමය, උන්වහන්සේව ලුහුබැඳීමට මට බලකරවයි. මක්නිසාද යේසුස්වහන්සේ සමග මා සම්පූර්ණය ( කිසිදෙයක අඩුවක්, නැතිවීමක් හෝ කැඩීමක් නැත) මක්නිසාද සියලු නාමවලට වඩා උසස්වූ, එකම එක නාමය වන යේසුස්වහන්සේගේ නාමයට සියලුම දේවල් යටත්ය.

යාච්ඤාව: මෙය දැඩිව යේසුස්වහන්සේව ලුහුබැඳීමට නැවත කැපවීමේ අවස්ථාවක් විය හැක.